# ඡායා රූ පිළිසඳර

2015
සැප්තැම්බර් / ඔක්තෝබර්

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka


## සේයා රූ ඇදුරු සමරු සමාජ මෙහෙවර

දිවංගත විල්සන් හැගොඩ සූරීන්ගේ සිය වැනි ජන්ම සංවත්සරය සමරා සිදු කළ වැඩසටහන් මාලාවේ පාසල් උපකරණ ප්‍රදානෝත්සව දෙකක් සැප්. 21 වන දින මුලතිව් කෝකිලායි සිංහල මහා විද්‍යාලයේ දී සහ කෝකිලායි දෙමළ විද්‍යාලයේ දී පැවැත්විණි.



මෙම සද්කාර්යය පාසල් උපකරණ හා පොත් පත් බෙදා දීම, දරුවන් සඳහා තේ පැන් සංග්‍රහයක්, ගුරු භවතුන් ට මුදල් තිළිණ ප්‍රදානයක් ඇතුළු අංග ගණනාවකින් යුක්ත විය. හිටපු සමාජ සේවා අධ්‍යක්ෂ වජිර වික්‍රමගේ මහතාගේ සංවිධායකත්වයෙන් පැවැත්වුණු මෙම ව්‍යාපෘතියට ජ්‍යෙෂ්ඨ සාමාජිකා රත්නා විජේසිංහ මහත්මියගේ පූර්ණ මූල්‍ය දායකත්වය හිමි විය. මෙය අමරා වීරසේකර මහත්මිය හා නෙරංජන් වික්‍රමාරච්චි මහතා ප්‍රමුඛව ශ්‍යාමලී කරුණාපාල, නන්දනී හෙට්ටිආරච්චි, තිනේෂා එදිරිසිංහ උදේනි අල්විස්, එස්. රාම්දාස්, නාරද අමරතුංගආරච්චි, නිමල් එදිරිතිලක, ඉන්දික දසනායක, ජයතිලක යන මහත්ම මහත්මීන්ගේ පූර්ණ සහභාගීත්වය සහිතව සිදු කෙරිණි.

මෙහි සාර්ථකත්වය සඳහා දායක වූ ඇට්ලස් පොත් සමාගමට සහ කඳන සිංහ සමාජයට සංගමයේ ස්තුතිය සහ ගෞරවය මෙයින් පිරිනැමේ.

## 62 වන වාර්ෂික මහා සභා රැස්වීම




පසුගිය සැප්තැම්බර් මස 13 වන ඉරු දින මහවැලි කේන්ද්‍රයේ දී පවත්වන ලද 62 වන වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරි නිල වර්ෂය සඳහා පත්කර ගනු ලැබූ අභිනව නිලධාරී මණ්ඩලය පහත සඳහන් ය. නව නිල වර්ෂයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා මෙම නිලධාරී මණ්ඩලය ඔබගේ පූර්ණ සහයෝගය හා ආශීර්වාදය ප්‍රාර්ථනා කරයි.

ගරු සභාපති - ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා
ගරු විධායක අධ්‍යක්ෂ - ශාන්ත ගුණරත්න මහතා
ගරු මුදල් අධ්‍යක්ෂ - තිනේෂා එදිරිසිංහ මෙය
ගරු අධ්‍යක්ෂ/අධ්‍යාපන - විජය බස්නායක මහතා
ගරු අධ්‍යක්ෂ ප්‍රදර්ශන - නාරද අමරතුංග ආරච්චි මහතා
ගරු අධ්‍යක්ෂ ප්‍රකාශන - සමල් පෙරේරා මහතා
ගරු අධ්‍යක්ෂ/ලේඛකාධිකාරී - උපනන්ද සෙනෙවිරත්න මහතා
ගරු අධ්‍යක්ෂ/සමාජ සේවා - සේනාරත්න බණ්ඩාර මහතා
ගරු අධ්‍යක්ෂ/සංවර්ධන - තුෂාර ඩී. සමරකෝන් මහතා


ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ දැක්ම සහ මෙහෙවර

දශක හය හමාරක අනුපමේය ඉතිහාසයකට හිමිකම් කියන අප සංගමය සිය ජාතික අරමුණු කුළුගන්වනු පිණිස දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ සම්පාදනය කොට ඇත. මෙම ප්‍රකාශ, 2015 ඔක්. 7 වන දින ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කොට මෙසේ ඔබගේ දැනගැන්ම පිණිස ඉදිරිපත් කෙරේ.

***දැක්ම***

*දේශයේ දූ පුතුන්ගේ ඡායාරූප කලා සාක්ෂරතාව හෘදය සංවේදී නිර්මාණශීලිත්වයෙන් ඔප් නංවමින්, ස්වාභිමානයෙන් සහ මානවවාදී ගුණයෙන් සුපෝෂිත කරලන ප්‍රමුඛතම ජාතික නිකේතනය ලෙසින් පෙරමුණ ගැනීම අපගේ දැක්ම වේ.*

***මෙහෙවර***

*ලාංකේය ඡායාරූප කලාවේ පෝෂණය උදෙසා අවැසි ඉගැන්වීම්, මගපෙන්වීම්, සහසම්බන්ධතා ගොඩනැංවීම් මගින් ඡායාරූප ශිල්පය සම්භාව්‍ය කලාවක් හා ප්‍රමිතිගත වෘත්තියක් ලෙස ස්ථාපිත කරලීම ද, ලෝක ඡායාරූප කලා සිතියමෙහි ශ්‍රී ලංකා නාමය ගෞරවාන්විතව මුද්‍රා තැබීම ද, ජාතික මෙන් ම අන්තර් ජාතික ඡායාරූප කලා හා සංස්කෘතික සංවිධාන සමග සහෝදරත්වයෙන් අත්වැල් ගනිමින් ප්‍රතිබිම්බ කලාවේදීන්, ප්‍රතිබිම්බ කලාලෝලීන් සහ ඡායාරූප ශිල්ප සංවිධාන සද්භාවයෙන් පෙළගැන්වීම ද අපගේ මෙහෙවර වේ.*



## එම්.එම්.ආර්. - දී.ග. ආශීර්වාද පූජාව

දැනට අසනීප තත්වයෙන් පසුවන එච්.එම්.ආර්. පෙරේරා සහ දී.ග. සෝමපාල යන සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන් දෙපළට ඉක්මන් නිරෝගි සුව පතා ආශීර්වාද පූජා පින්කමක් සැප්. 19 වන දින මාලිගාකන්ද අග්‍රශ්‍රාවක මහා විහාරයේ දී පැවැත්විණි. තෙල්, මල්, පහන්, සුවඳ දුම්, අෂ්ටපාන සහ සිවුරු පිරිකර පූජාවන් මෙදින සිදු කෙරුණු අතර සියලු සාමාජික භවතුන්ගේ බලාපොරොත්තු ප්‍රාර්ථනා පරිදි පෙරේරා සූරීන්ට හා සෝමපාල සූරීන්ට නිදුක් නිරෝගී භාවය, දීර්ඝායුෂ ප්‍රාර්ථනා කෙරේ. මෙම පුණ්‍ය කාර්යය ජ්‍යෙෂ්ඨ සාමාජිකා අමරා වීරසේකර මහත්මියගේ සංවිධායකත්වයෙන් සහ ජ්‍යෙෂ්ඨ සාමාජික පිරිසකගේ සහභාගීත්වයෙන් සිදු කෙරිණි.

## 2016 වසර සඳහා නවකයින් බඳවා ගැනීම

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය 2016 වර්ෂය සඳහා නවකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කොට තිබේ. සංගමය සම්බන්ධ වීමට කැමති ඔබේ හිතවතුන්ට මේ බැව් දන්වා එම කාර්යය සම්බන්ධීකරණය කරලීම ඔබගෙන් සංගමය වෙත සිදු කෙරෙන ඉමහත් සේවාවකි.

අයදුම් පත්‍ර ගරු ලේඛකාධිකාරී උපනන්ද සෙනෙවිරත්න මහතා වෙතින් හෝ www.npasslanka.org වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය. අයදුම්පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කොට භාරදිය හැකි අවසන් දිනය 2015 දෙසැම්බර් 31 වේ. අදාළ සම්මුඛ පරීක්ෂණ ජනවාරි මස 17 වන දින පැවැත්වීමට නියමිතව ඇති අතර ජනවාරි 31 දින නව වසරේ පන්ති ආරම්භ කෙරෙනු ඇත.

## 2016 සාමාජිකත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය

2016 වසර ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජික ප්‍රවර්ධන වසර ලෙස නම් කර ඇති අතර, ඒ අනුව සාමාජිකයින් වෙත විශේෂ අධ්‍යයන හා සාමාජික ප්‍රවර්ධන කට්ටලයක් ලබාදීමට කටයුතු යොදා ඇත. එයට සංගමයේ ශිෂ්‍ය අත්පොත, ටීෂර්ට් එකක්, සටහන් පොතක්, ෆයිල් කවරයක්, පෑනක් මෙන් ම 60 වන සංවත්සරය වෙනුවෙන් ප්‍රකාශයට පත්කළ රු. 1800/ ක වටිනාකමින් යුත් අභිනන්දන ග්‍රන්ථය ද (Felicitation NPAS) අයත් වේ.

ඒ අනුව 2016 වසර සඳහා බඳවාගන්නා සාමාජිකයින් ආරම්භක ගාස්තුව ලෙස රු. 3000/ ක මුදලක් ගෙවිය යුතු අතර, ඉන් අනතුරුව ඊළඟ වසරේ සිට රු. 500/ බැගින් වන වාර්ෂික සාමාජික ගාස්තුව පමණක් ගෙවිය යුතු වේ. දැනට සංගමයේ සාමාජිකත්වයට හිමිකම් කියන ඔබට ද 2016 වසරේ සාමාජික ගාස්තුවට අමතරව රු. 2000/- ක මුදලක් ගෙවා මෙම ප්‍රවර්ධන කට්ටලය ලබාගත හැකි බව සතුටින් දන්වා සිටිමු.

## 2015 වාර්ෂික පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය දෙසැ. 05 දා

සංගමය මගින් සංවිධානය කරන පාඨශාලීය ඡායාරූප පරීක්ෂණය දෙසැ. 5 වැනි දින කොළඹ ඇතුළු මධ්‍යස්ථාන කිහිපයක දී පැවැත්වීමට අපේක්ෂා කෙරේ. ඔබ කිසියම් පාසලක/පාසල්වල ඡායාරූප පාඨමාලා හා සම්බන්ධව සිටී නම්, එම සිසු සිසුවියන් මෙම පරීක්ෂණයට සහභාගී කරවා ඔවුනට ඡායාරූප ශිල්පය පිළිබඳ ප්‍රාථමික තලයේ ජාතික ඇගයීමක් ලබාදීමට හැකියාව ඇත මේ පිළිබඳ වැඩි විස්තර ගරු ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ (විභාග) උපනන්ද සෙනෙවිරත්න මහතා (0714901200) වෙතින් විමසන්න.

## ඡායාරූප පාඨමාලා පරීක්ෂණය - 2015

මෙම වසරේ ප්‍රථම, දෙවන හා ඩිප්ලෝමා පන්තිවල ඡායාරූප පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් සඳහා වන ඡායාරූප ශිල්ප පරීක්ෂණ 2016 ජනවාරි 10 වන දින පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. අපේක්ෂකයින් සඳහා විභාග අයදුම්පත් දැන් ලබා ගත හැකි අතර, ඒවා සම්පූර්ණ කොට ආපසු භාරදීම 2015 නොවැ. 30 දිනට පෙර සිදු කළ යුතු ය. අවශ්‍ය වැඩි විස්තර ගරු ලේඛකාධිකාරී උපනන්ද සෙනෙවිරත්න මහතා හෝ ගරු අධ්‍යාපන අධ්‍යක්ෂ විජය බස්නායක මහතා වෙතින් ලබා ගන්න.

## ප්‍රථම වර්ෂ ඡායාරූප පරීක්ෂණයට බාහිර අයදුම්කරුවන් සහභාගී කරවීම.

සංගමයේ තුන් අවුරුදු පාඨමාලවේ ප්‍රථම වසර සඳහා සාමාජික නොවන බාහිර අයදුම්කරුවන්ට ද ඉදිරිපත් විය හැකි ය. මේ සඳහා ඉදිරිපත් වීමට හැකියාව ඇති ඔබගේ හිතමිතුරන් වේ නම්, ඒ බව ඔවුන් වෙත දැනුම් දෙන්න. අවශ්‍ය විභාග අයදුම්පත් ගරු ලේඛකාධිකාරී උපනන්ද සෙනෙවිරත්න මහතා සහ පන්ති කටයුතු භාර එස්.ඩී. පියදාස මහතා වෙතින් ලබාගෙන නිසි පරිදි සම්පූර්ණ කරවා යළි සංගමයට භාර දෙන්න. මෙය ඡායාරූප ශිල්පය කෙරෙහි ලැදියාවක් දක්වන හා ඒ පිළිබඳ මූලික න්‍යායාත්මක අවබෝධයක් ඇති ඔබේ හිතවතුන් වෙනුවෙන් ඔබට කළ හැකි අගනා මෙහෙවරකි.

## *ලබා නොගත් ඔබගේ විභාග සහතික ?*

*පසුගිය වසර ගණනාවක් තුළ නිකුත් කිරීමට සූදානම් කොට තිබූ එහෙත් රැගෙන නොගිය විභාග සහතික රාශියක් සංගමයේ ලේඛකාධිකාරීතුමන් වෙත ඇත. ඔබ ද තමන්ට හිමි විභාග සහතික මෙතෙක් ලබා ගෙන නොමැති නම් 0714901200 අංකයෙන් උපනන්ද සෙනෙවිරත්න මහතා අමතා වහා ම එම සහතික පත්‍ර ලබාගන්න.*

## අතපසු වූ යුතුකම

හිඟ සාමාජික මුදල් ගෙවා ඔබේ සාමාජිකත්වය රැකගන්න.
මෙතෙක් ගෙවන්නට අතපසු වූ ඔබේ සාමාජික මුදල් පිළිබඳ ලිපියක් 2015 ජූලි 10 දාතමැතිව ඔබ වෙත ලැබී තිබේද? එහි සඳහන් වූ පරිදි ඔබ ඔබගේ හිඟ සාමාජික මුදල ගෙවා අදාළ කුවිතාන්සිය මුදල් අධ්‍යක්ෂ වෙත භාර නොදුන්නේ නම්, ඔබේ නම සාමාජික නාම ලේඛනයෙන් ඉවත් කිරීමට නියමිත ව තිබිණි. එසේ හිඟ මුදල් ගෙවිය හැකි අවසන් දිනය ඔබගේ කාර්යබහුල භාවය සලකා නොවැ. 30 දක්වා දීර්ඝ කරන ලදි. මෙම කාලසීමාව කිසි ලෙසකින් නැවත දීර්ඝ නොකරන අතර ඔබගේ සාමාජිකත්වය ආරක්‍ෂා කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු. හිඟ සාමාජික මුදල් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ලංකා බැංකුව බම්බලපිටිය ශාඛාවේ ජංගම ගිණුම් අංක 717752 ට බැර කර එම කුවිතාන්සියේ මුල් පිටපත සංගමයේ මුදල් අධ්‍යක්ෂ වෙත බාරදෙන්න. නොඑසේ නම් මුදලින් හෝ සංගමයේ නමට ලියන ලද චෙක්පතක් මගින් මුදල් අධ්‍යක්ෂ වෙත ගෙවිය හැකි ය. මේ පිළිබඳ වැඩිමනත් විමසුමක් වේ නම් ගරු මුදල් අධ්‍යක්ෂිකා තිනේෂා එදිරිසිංහ මෙනෙවිය (0710934771) අමතන්න.

## ඉටු කරන ලද යුතුකම

ඉටු කළ යුතු යුතුකම තවදුරටත් අර්ථවත් කරලන්න. ඉහත කී පරිදි සාමාජික මුදල් ගෙවීමෙන් ඔබ ඔබේ යුතුකම ඉටු කිරීම ප්‍රශංසාත්මක ය. එසේ ම එම යුතුකම ඉටු කිරීමට අතපසු වූ ඔබේ හිතවතුන් වේ නම්, ඒ ගැන සිහිපත් කොට සාමාජික මුදල් ගෙවා සාමාජිකත්වය ආරක්ෂා කරගන්නට ඔවුන් පොලඹවන්න. එමගින් ඔබ විසින් ඉටු කරන ලද ප්‍රශංසාත්මක යුතුකම වඩාත් ප්‍රශස්ත වනු ඇත.

## 'අධ්‍යාපන' ප්‍රදර්ශන කුටිය.




ඔක්. 02, 03, 04 දිනවල බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද අධ්‍යාපන ප්‍රදර්ශනය සඳහා සංගමය මගින් ඉතා සාර්ථක ප්‍රදර්ශන කුටියක් සංවිධානය කර තිබිණි. පසුගිය 17 වැනි FIAP ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ නිර්මාණ ප්‍රදර්ශනය, ඡායාරූප ශිල්ප දේශන සංවිධානය, ඡායාරූප සඟරා සහ පොත් පත් අලෙවිය ඇතුළු වැඩසටහන් ගණනාවක් ඊට ඇතුළත්ව තිබුණි.

මෙහි විශේෂ දේශන සඳහා හර්ෂ මධුරංග ජයසේකර, මීෂා ගුණවර්ධන, රොහාන් පොන්සේකා යන ප්‍රවීණයින්ගේ දායකත්වය ලැබුණු අතර මේ සම්බන්ධව ඔවුනට උණුසුම් වූ ස්තුතිය පුද කෙරේ. සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ තුෂාර ධම්මික සමරකෝන් මහතාගේ මෙහෙයවීමෙන් සිදුකෙරුණු මෙම කාර්යයේ සම්බන්ධීකරණ කටයුතු සහ අනුග්‍රහකත්වය ලබාදීම සාමාජික වින්දන ඒකනායක මහතාගේ කැපවීමෙන් සිදු කෙරුණි. දින තුනක් පුරා පැවැත්වූ ප්‍රදර්ශන කුටියේ කාර්යයන් සාර්ථක කර ගැනීමට උදව් උපකාර කළ සියලු ම සාමාජික හිතවතුන්ට සංගමයේ ගෞරවය හිමි වේ.

## ඡායාරූප පාඨමාලා දේශකවරු බඳවාගැනීම

සංගමයේ තුන් අවුරුදු ඡායාරූප ශිල්ප පාඨමාලාවට දේශන පැවැත්වීමෙන් දායක වීමට කැමති ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන්ට ඒ සඳහා මෙයින් ඇරයුම් කෙරේ. ඔබ ඡායාරූප ශිල්පයේ කිසියම් විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ විශේෂිත ප්‍රාගුණ්‍යකින් යුතු අයෙකු නම්, එම දැනුම සංගමයේ පන්තිවල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන් සඳහා නොමිලේ ප්‍රදානය කිරීමට මෙය අගනා අවස්ථාවකි. මේ සඳහා එක් වීමට කැමති නම් ඔබේ නම, ලිපිනය ඇමතුම් අංක, අධ්‍යාපන සුදුසුකම්, විශේෂිත ක්ෂේත්‍රය, පළපුරුද්ද සහ තොරතුරු 'ගරු අධ්‍යක්ෂ අධ්‍යාපන' නමින් සංගමයට යොමු කරන්න.

## *2016 වසරට ANPAS - FNPAS අයදුම් කිරීම*

*2016 වසරේ වාර්ෂික මහා සභාව සහ වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය වසර මැද භාගයේ පැවැත්වීමට නියමිතව ඇති බැවින් එහි දී ප්‍රදානය කිරීමට නියමිත ANPAS - FNPAS සම්මාන සඳහා කල් වේලා ඇතිව අයදුම්පත් කැඳවීමට තීරණය කොට ඇත. මේ සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන සාමාජිකයින් අදාළ වැඩිමනත් විස්තර 2016 ජනවාරි 31 ට පෙර ගරු අධ්‍යාපන අධ්‍යක්ෂ විජය බස්නායක මහතා වෙතින් ලිඛිතව විමසිය යුතු වේ.*

## මුතුරාජවෙල සොබාදහම් වැඩමුළුව




ඡායාරූප පාඨමාලා විද්‍යාර්ථීන් සඳහා වන සොබාදහම් වැඩමුළුව මෙවර මුතුරාජවෙල දී පවත්වන ලදී. කඩොලාන පරිසරයේ සත්ව හා ශාක රූගතකරණය, කුරුලු ඡායාරූපකරණය, බෝට්ටු චාරිකා, පරිසර පද්ධති අධ්‍යයනය ඇතුළුව විරල ගණයේ අත්දැකීම් සමුදායක් මෙයට සහභාගී වූවන්ට ලබාගත හැකි විය. මෙහි දේශන හා විශේෂ මාර්ගෝපදේශනය රොහාන් ෆොන්සේකා මහතා සහ කේ. ජී. කීර්තිරත්න මහතා විසින් සිදු කරන ලදී. එම දෙපළට සහ සංවිධායක කමිටුවට සංගමයේ ස්තුතිය හිමි වේ.

### ඔබේ තොරතුරු පිළිසඳරට එවන්න

ඔබේ ජයග්‍රහණ, ජීවිතයේ වැදගත් අවස්ථා ඇත්නම් සියලු අත්දැකීම් සමස්ත සාමාජිකත්වයත් සමග බෙදා හදා ගන්න. ඔබේ තොරතුරු පිළිසඳරට යොමු කරන්න.

**ගරු ප්‍රකාශන අධ්‍යක්ෂ,**

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,**

**170, කොළොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.**

### නිරෝගී සුව ප්‍රාර්ථනා

අසනීප තත්වයෙන් පසුවන දී.ග සෝමපාල ඩී.ජී. රණතුංග එච් එම් ආර් පෙරේරා යන මහත්වරුන්ට ඉක්මන් නිරෝගී සුව ප්‍රාර්ථනා කරමු. අනපේක්ෂිත හදිසි අනතුරකට මුහුණපෑමෙන් දැඩි අසාධ්‍ය තත්වයෙහි පසුවන හිටපු සංස්කෘතික අධ්‍යක්ෂ අප සංගමයේ ගරු සභාගී සාමාජික විජිත් කණුගල මහතාට නිරෝගී සුව ලබා සුපුරුදු ලෙසම අප සමග එක්වන්නට හැකි වේවායි ප්‍රාර්ථනා කරමු.

## පාසල් ඡායාරූප පාඨමාලා විෂය නිර්දේශය සංස්කරණය වේ.

2008 වසරේ දී හඳුන්වා දෙනු ලැබූ පාසල් ඡායාරූප පාඨමාලා විෂය නිර්දේශය සංස්කරණය කොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත.

ඔබ ද පාසල් ඡායාරූප පාඨමාලාවකට සම්බන්ධ වේ නම් එම විෂය නිර්දේශය පරිදි පාඨමාලා කටයුතු සංවිධානය කළ හැකි වේ. ඉන් අනතුරුව වර්ෂ අවසානයේ පැවැත්වෙන පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණයට දූ දරුවන් ඉදිරිපත් කොට ඔවුන්ට ඉන් සුදුසුකම් ලබාදීමට හැකියාව ලැබෙනු ඇත.

# හඳුනාගත්තොත් ඔබ මා...

## හැගොඩ පිළිවෙත් අනුව යන දකුණේ කොල්ලා..

## ඕන්ටන් ජයසූරිය



ශ්‍රීලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අංක 1 යටතේ ලියවෙන නාමය විල්සන් හැගොඩ වන්නා සේ ම, අංක 2 යටතේ සඳහන් වන නාමය ඕන්ටන් ද සිල්වා ජයසූරිය යන්නයි. ලාංකේය ඡායාරූප කලාවේ රුව ගුණ ඔසවා තබන්නට විල්සන් හැගොඩයන් යම් සේවාවක් සිදු කළේ ද, එකී සෑම කාර්යයක ම අනිවාර්ය කොටස්කරුවෙකු හා නිත්‍ය සාමාජිකයෙකු ලෙස කටයුතු කළ ජයසූරිය මහතා හැගොඩ මහතාගේ අභාවයෙන් පසු හැගොඩ නාමය සුරකින්නට ඉදිරිපත් වූ ප්‍රමුඛතමයා ද වෙයි.

1934 දී ගාලු දිස්ත්‍රික් මහවිද්‍යානේවරයෙකු වූ අමරියස් ද සිල්වා ජයසූරිය හා පියදිගමගේ සිසිලියා ජයසූරිය යුවලට දාව සහෝදරියන් 4 දෙනෙකුගෙන් යුතු පවුලක එක ම පිරිමි දරුවා ලෙස කොග්ගල දී උපත ලැබූ ඕන්ටන් ජයසූරිය මහතා ගාල්ල මහින්ද සහ ශාන්ත ඇලෝසියස් යන පාසල්වලින් අධ්‍යාපනය ලබා ගැටවර වියේ දී අගනගරයට පා තැබුවේ රැකියාවක් බලාපොරොත්තුවෙනි. තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කළ සිය වැඩිමහල් සොහොයුරියගේ සහය පිණිස ටොරින්ටන් තැපැල් කාර්යාලයේ සේවයට එක් වූ ඔහු පසුව සහකාර තැපැල් ස්ථානාධිපතිවරයෙකු ලෙසින් සිය වෘත්තියෙහි නිමග්න විය.

1960 වසරේ දී ඕන්ටන් ජයසූරියයන් හට හැගොඩ මහතා හමුවන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊට යාබදව පිහිටා තිබූ හෙයිනි. හැගොඩ මහතා රැගෙන එන ලියුම් තොගයට මුද්දර නිකුත් කොට අදාළ මුදල ලාච්චුවට බහාලනු වෙනුවට, මේ අපූරු මිනිසා ලියුම් යතුරු ලියනය, කවරවල බහාලීම, මුද්දර ඇලවීම, තැපැල් කිරීම ඇතුළු සියලු කාර්යයන් සිය කැමැත්තෙන් ම භාරගත්තේ ය. ස්වකීය සමාජ මෙහෙවරට ආශීර්වාදාත්මක ශ්‍රම දායකත්වය අපේක්ෂාවෙන් සිටි හැගොඩ මහතාට මේ සම්බන්ධය යෝධ බල, යෝධ වීරිය ගෙනදෙන්නක් විය. ලිපි තැපෑලෙන් ඇරඹුනු මෙම හිතමිතුරුකම වැඩිකල් යාමට ප්‍රථම නිල ආයතනික ගනුදෙනුවක් බවට පත්විය. ඒ අනුව එවක සංගමය වෙනුවෙන් කැපවී සිටි ල. දයානන්ද, හිල්ටන් සමරසිංහ, ජී.එල්.ආර්. ද සිල්වා, ඒ.එස්. ජයතිස්ස, එම්.ජී. පියදාස වැනි ප්‍රමුඛයන් අතරට ඕන්ටන් ජයසූරිය නාමය ද එක්විය.

ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ කාරක සභිකයෙකු ලෙස එහි නිල මණ්ඩලයට එක් වූ ජයසූරිය මහතා දීර්ඝ කාලයක් භාණ්ඩාගාරිකවරයා වශයෙන් සේවය කළේ ය. 1984 පටන් ප්‍රධාන ලේකම්වරයා ද 1988 පටන් විධායක අධ්‍යක්ෂවරයා ද වශයෙන් 1999 දක්වා ඔහු පූර්ණ කාලීනව සංගමයේ උන්නතිය වෙනුවෙන් කැපවිය.

එහි දී සංගමයේ ප්‍රකාශන, පාඨමාලා සංවිධාන කටයුතු, චාරිකා, වැඩමුළු සියල්ලෙහි ඉදිරිපෙළ අසුනක් ඕන්ටන් ජයසූරිය නමට වෙන් කර තිබිණි. කාගේත් ගරු බුහුමනට පාත්‍ර වෙමින් එහි රැඳී සිටි ජයසූරිය මහතාගේ විශේෂත්වය වූයේ සෑම විටක ම දැඩි විනයානුකූල ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ය. කිසියම් ප්‍රමාදයක දී, කට වැරදීමක දී ජයසූරිය මහතා බෙහෙවින් කිපෙයි. හැගොඩ මහතාගේ පිළිවෙත් සිහියට නගමින් ඔහු මහ ප්‍රසිද්ධියේ ම ගැටලුව විවේචනය කරයි. කතාව අවසන් කරන්නේ ''මම දකුණේ කොල්ලෙක්'' යනුවෙනි. ඒ කතාවේ යටි අරුත තමා පිළිබඳ අභිමානයකට වඩා හැගොඩ මහතා මෙන් ම තමා ද දකුණු ලකෙන් පැමිණියෙකු බව ය. අපි මේ ආදර්ශවත් සමාජ ප්‍රගතිගාමියාට ගරු බුහුමන් පිරිනමමු. ඔහු ආදර්ශයට ගනිමු. ඔහුට නිරෝගී සුව හා දීර්ඝායුෂ පතමු!

- උදිත ගයාෂාන්

---

### SONY සමාගමෙන් සාමාජිකයින් සඳහා A7 අංකිත කැමරා පිළිබඳ වැඩමුළුවක්

සෝනි සමාගම විසින් මෑතක දී හඳුන්වා දෙනු ලැබූ සෝනි A7 අංකිත කැමරා ශ්‍රේණිය පිළිබඳ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු පිරිසක් වෙනුවෙන් ඔක. 24 දින කොළඹ ටාජ් හෝටලයේ දී විශේෂ වැඩමුළුවක් එම ආයතනය මගින් පැවැත්විණි. එමෙන් ම සංගමයේ සාමාජික හවතුන් සඳහා ද විශේෂ වැඩමුළු 2 ක් පැවැත්වීමට සෝනි සමාගම ඉදිරිපත් වී සිටී. මෙය නොවැම්බර් මස 16 වෙනි සඳුදා දින කොළඹ දී පැවැත්වේ.

---


### ආලෝකකරණ වැඩමුළුව - ගාල්ල

ආලෝකකරණය පිළිබඳ ප්‍රායෝගික දෙදින වැඩමුළුවක් නොවැ. 28, 29 දිනවල ගාල්ලේ දී පැවැත්වීමට අධ්‍යාපන අංශය මගින් සියලු විධිවිධාන සැලසුම් කොට ඇත. ප්‍රායෝගික ක්‍රියාකාරකම් එළිමහන් හා චිත්‍රාගාර ආලෝකකරණය පිළිබඳ න්‍යායාත්මක මගපෙන්වීම්, නිර්මාණාත්මක ආලෝකකරණයේ රහස්, ලොව ප්‍රකට ඡායාරූප කලාවේදීන්ගේ ආලෝකකරණය සම්බන්ධ අත්හදා බැලීම් මෙයට ඇතුළත් ය. මෙහි සම්පත් දායකයින් වශයෙන් හෙන්රි රාජකරුණා ශාන්ත ගුණරත්න, හර්ෂ මධුරංග ජයසේකර, අතුල රණරාජ යන මහත්වරු සහභාගී වනු ඇත.

සංගමයේ අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන් 70 ක් ඇතුළුව 85 දෙනෙකුගේ කණ්ඩායමක් මේ සඳහා සහභාගී වීමට නියමිත ය. ප්‍රේමසිරි හිඳුල්ලආරච්චි, සාලිය ලියනගේ යන මහත්වරු සංවිධාන කාර්යයෙන් මෙයට දායක වෙති.

# හඳුනාගත්තොත් ඔබ මා...

## කඳුකරයේ තෙවැනි ඇස - ඩී.ජී. රණතුංග



කටු කොහොල්, මල් එල බර වූ දිගු ගමන් මගක එකට ම අත්වැල් බැඳ සපැමිණි සිය බිරිඳ සමග වියපත් දිවිය සන්සුන් විවේකයකින් ගෙවමින් සිටින මේ සොඳුරු මිනිසා, එවකට 'ලංකා ජාතික ඡායාරූප සංගමය' නම් ආයතනයේ සාමාජික අංක 33 සහ යාවජීව සාමාජික අංක 3 හිමි පරිණත ඡායාරූප ශිල්පියෙකු වූ "දියගැල්මේ ගුණපාල රණතුංග" යන් ය.

දරුවන් හත් දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමහල් පිරිමි දරුවා ලෙස ය 1929 සැප්තැම්බර් මස ඔහු උපන්නේ. සුවිශාල වගකීම් රැසක් වැඩිමලා ලෙස ඔහුට උපතින් ම උරුම විය. ළපටි කල නුගවෙල කණිෂ්ඨයට ඇතුළු වුවත් දැඩි ආර්ථික පීඩනය නිසා ම අධ්‍යාපනය අතරමග ඇන හිටිණි. ඉනික්බිති කටුගස්තොට ශ්‍රී රාහුල විද්‍යාලයට දෙවන ශ්‍රේණිය සඳහා ඇතුළත් වන විට, ඔහු වයසින් වැඩි දරුවෙකු වීය. ඉතා දක්ෂ ලෙස අධ්‍යාපනය හැදෑරූ බැවින් එක වර දෙවන ශ්‍රේණියේ සිට හතර වන ශ්‍රේණිය උසස් කෙරිණි. සිංහල කණිෂ්ඨය දක්වා දැඩි පීඩා මැද වුවත් පාසල් ගමන සාර්ථක ලෙස නිම කළේ ය.

1953 දී රු. 28/- කට කැමරාවක් මිලට ගත් ඔහු කැමරාවේ විවිධ උපාංග වෙනස් කරමින් එක ම දර්ශනය ඡායාරූප ගත කළේ ය. පළමු පටල පටියේ ඡායාරූප අටෙන් දෙකක් නිවැරදි වූ අතර, ඊළඟ පටලයේ පිංතූර අට ම නිවැරදි විය. ඉමහත් තෘප්තියට පත් ඔහු කළේ වැඩි වැඩියෙන් ස්වයං අධ්‍යයනයේ යෙදීම ය. එතෙක් ඉතිරි කරගෙන තිබූ රු. 300/-න්, ඇඩොක්ස් ෆෝල්ඩින් වර්ගයේ කැමරාවක් මිලට ගෙන ගමන ඉදිරියට ම ගියේ ය. කැමරා සඟරාව ඇස ගැටුනේ ඔය අතරතුර දී ය. එය කියවමින් ඒ ඔස්සේ සිත දිවවූ ඔහු කැමරා සඟරාවට පිංතූර එවීය. ඡායාරූප ක්‍රියාකාරකම් එලෙස සිදුවෙද්දී නුවර හිල්වුඩ් විද්‍යාලයේ රැකියාවක් ඔහුට ලබාගත හැකි විය.

ප්‍රථම වරට දළදා මැදුරේ විදුලි ආලෝකය දල්වන රාත්‍රි ඡායාරූපයක් ගැනීමට ගුණපාලයන් සමත් විය. එම ඡායාරූපය කැමරා සඟරාවේ පළවිය. විල්සන් හැගොඩ සූරීන් සමග එලෙස ඇති වූ සහසම්බන්ධතාව, කැමරා සඟරාව මහනුවර විකිණීම දක්වා ඇදී ගියේ ය.

ශ්‍රී ලංකා විද්‍යාලයේ පටන්ගත් කැමරා පංතිවලට සහභාගිවීමට රණතුංගයන්ට අවස්ථාව හිමි විය. එවකට ශ්‍රී ලංකා විද්‍යාලයේ පවත්වන ලද කැමරා පංතිවලට පැමිණ ඉරිදා රාත්‍රිය "නාමල්" සෙවනේ ගත කර රාත්‍රි දෙකට නුවර යන බසයෙන් සඳුදා රාජකාරිය සඳහා පිටත්ව ගියේ ය.

හැගොඩ මහතාගේ දිරිගැන්වීම මත 1969 ජනවාරි 10 දින නුවර මල්වත්ත පංසලේ සඟරාජ දහම් ශාලාවේ කඳුරට ප්‍රථම කැමරා පංතිය ඇරඹිණි. අනතුරුව හැගොඩ මහතාගේ මග පෙන්වීම මත සාමාජිකයින් 19 එක්ව කඳුරට ඡායාරූප සංගමය බිහිවිය. මේ දක්වා කඳුරට ඡායාරූප සංගම් ඉතිහාසය පුරා සිටි එක ම සභාපතිවරයා දියගැල්මේ ගුණපාල රණතුංගයන් ය.

ගුණපාල රණතුංග සූරීන් විසින් මෙරට ඡායාරූප කලාවට කරන ලද ශිල්පීය නිපුණතාව සහ සේවාව සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ඇසුරු සාමාජිකත්වය (ANPAS) සහ ගෞරව සහාගී සාමාජිකත්වය (Hon. FNPAS) යන සම්මාන ද, මහනුවර සංස්කෘතික සංගමය මගින් 1996 දී රත්නදීප සම්මානය ද, 2000 වසරේ දී විල්සන් හැගොඩ පදනමෙහි ඡායාරූප සම්මානය ද, 2001 වසරේ ශ්‍රී ලංකා ඡායාරූප ශිල්පීන්ගේ ආයතනයේ ගරු සහාගී සම්මානය (Hon. FISLP) ද පිරිනැමී තිබේ. එසේ ම ඔහුගේ අඩ සියවසක සේවාවට බුහුමන් පුදමින් උපහාර උළෙලක් සහ සමරු දේශනයක් ද 2011 නොවැම්බර් මාසයේ දී පැවැත්වීමට කඳුරට ඡායාරූප සංගමයේ කෘතවේදී සාමාජිකත්වය ඉදිරිපත් වීම ප්‍රශංසා කටයුතු ය.

ඡායාරූප කලාවේ ළබැඳි සාමාජිකයින් හට තම කාලයෙන් බිඳක් එතුමන් හා පිළිසඳරට පුද කළ හැකි නම්, හැට වසරක සමාජ ජීවිතය අපතේ ගිය සේ ඔහුට නොහැඟෙනු ඇත. විශ්‍රාම ගොස් 20 වසරක් ගෙවී තම බිරිඳ සමග හුදෙකලාව තම වියපත් සැඳෑ සමය ගෙවන ඔවුන් දෙපළට නිදුක් නිරෝගි සුව ලැබ තව චිරාත් කාලයක් අප සමග වෙසෙන්නට වාසනාව උදා වේවායි ප්‍රාර්ථනා කරමු.

**- ශ්‍යාමලී කරුණාපාල**

### අපේ ශෝකය

- සංගමයේ ගරු සහාගී සාමාජික සරත් පෙරේරා මහතාගේ මෑණියන් පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ එම පවුලේ සැම වෙත සංගමයේ බලවත් ශෝකය පිරිනමමු.
- යාවජීව සාමාජික ජී. හතරසිංහ (LM 86) මහතාගේ මෑණියන් අභාවයට පත්විය. එම පවුලේ සැමදෙනා වෙත සාමාජික සැමදෙනාගේ සංවේගය ප්‍රකාශ කරමු.

### ස්පාඤ්ඤයේ ඡායාරූප ඇගයීම් සඳහා බන්දුට ඇරයුමක්

ස්පාඤ්ඤයේ Liga Española ඩිජිටල් ඡායාරූප තරගාවලියේ තේරීම් කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට කීර්තිමත් ශ්‍රී ලාංකික ඡායාරූප කලාවේදී බන්දු ගුණරත්න මහතාට ඇරයුම් ලැබී ඇත. මෙම ඇගයීම් අන්තර්ජාලය හරහා සිදුකිරීමට නියමිත ය. මේ පිළිබඳ ගුණරත්න මහතාට සංගමයේ සුබපැතුම් පිරිනැමේ.

# අනුකමිටු පත්කිරීම

සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ඉදිරි කාර්යයන් සඳහා පිහිටුවන ලද කමිටු පහත සඳහන් වේ.

## සභාපතිවරයා යටතේ වන කමිටු

### මුලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුව

මංගල එදිරිසිංහ මහතා
පියසේන කෝරළේවිදාන මහතා
සිතුමිණි රත්නමලල මහතා
ඉන්දික ප්‍රනාන්දු මහතා
සිසිර කුමාර මහතා

### ජාත්‍යන්තර සම්බන්ධතා උපදේශන කමිටුව

එන්. ආර්. අභයසිංහ මහතා
හෙන්රි රාජකරුණා මහතා
බන්දු ගුණරත්න මහතා
ජී. හෙට්ටිආරච්චි මහතා

### වෘත්තීය කණ්ඩායම

උදේනි අල්විස් මහතා
සම්පත් පීරිස් මහතා
සාලිය ලියනගේ මහතා
අතුල රණරාජ මහතා

## මුදල් අධ්‍යක්ෂවරිය යටතේ වන කමිටුව

මූල්‍ය කළමනාකරණ කමිටුව
කීර්ති නිශ්ශංක මහතා
දීප්ති රත්නායක මෙය

## අධ්‍යාපන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටු

### අධ්‍යාපන කමිටුව

සභාපති, අධ්‍යාපන අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ, ලේඛකාධිකාරී
එස්. ඩී. පියදාස මහතා
ප්‍රේමසිරි හිඳල්ලආරච්චි මහතා
දුමින්ද වේරගොඩ මහතා
සමන් කුලසූරිය මහතා
ශාන්තිලාල් ප්‍රනාන්දු මහතා

### අධ්‍යාපන වැඩමුළු සංවිධාන කමිටුව

චන්ද්‍රසේන පෙරේරා මහතා
සමන්ත සේනක බණ්ඩාර මහතා
ප්‍රියන්ත අබේසුන්දර මහතා
කේ. ජී. කීර්තිරත්න මහතා
ඩී. කේ. ලැන්ට් මහතා

### මාසික තරඟ සංවිධායක කමිටුව

ඉඳුනිල් ජීවන්ත මුණසිංහ මහතා
නන්දනී හෙට්ටිආරච්චි මෙය
ජයලත් ප්‍රේමවංශ මහතා
මධුරංග අබේවර්ධන මහතා

## ලේඛකාධිකාරී අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටු

### විභාග පරිපාලන කමිටුව

රාහුල පෙරේරා මහතා
ටී.එස්.ටී. ද සිල්වා මහතා
ප්‍රියන්ත අමරසිංහ මහතා
රෝහිත ගුණවර්ධන මහතා
එල්. බී. එස්. එස් බාලසූරිය මහතා
සමන් ප්‍රනාන්දු මහතා
රවීන්ද්‍ර ප්‍රියන්ත ලාල් මහතා

### බඳවාගැනීම් කමිටුව

අමරා වීරසේකර මිය
ඩබ්. එම්. එස්. බණ්ඩාර මහතා
ගාමිණී ආර්. ෆොන්සේකා මහතා
ඡායා අබේවර්ධන මහතා
ජේ. පී. ද අල්විස් මහතා
හර්ෂ මධුරංග ජයසේකර මහතා
නෙරංජන් වික්‍රමආරච්චි මහතා

## ප්‍රදර්ශන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටුව

### ප්‍රදර්ශන කමිටුව

ඉඳුනිල් ජීවන්ත මුණසිංහ මහතා
මධුරංග අබේවර්ධන මහතා
ජයලත් ප්‍රේමවංශ මහතා
සමිත ප්‍රනාන්දු මහතා
1 වසර - තිනෙත් පෙරේරා මහතා 0719494904
ජගත් සූරියප්පෙරුම මහතා 0714407958
2 වසර - අසිත නානායක්කාර මහතා 0755090936
සුරේෂ් වීරසිංහ මහතා 0779100999
3 වසර - මනෝජ් වලේබොඩ මහතා 0718414875
ප්‍රිශාන් පෙරේරා මහතා 07779306375

## සමාජ සේවා අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටුව

### සමාජ සේවා කමිටුව

ශ්‍යාමලී කරුණාපාල මිය
කේ.ජී. කීර්තිරත්න මහතා
ශ්‍රියා ජීවා ද සිල්වා මෙය
නන්දනී හෙට්ටිආරච්චි මෙය
එම්.ජේ. පෙරේරා මහතා
එස්. රාම්දාස් මහතා
1 වසර - එච්. පී. කුලරත්න මහතා 0718061340
ඉරේෂ් රණසිංහ මහතා 0710364722
2 වසර - අමිල ගුණවර්ධන මහතා 0713042650
3 වසර - චන්දු ගුණවර්ධන මහතා 0716529423

## සංවර්ධන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටුව

### සංවර්ධන අනු කමිටුව

දුමින්ද පුෂ්පකුමාර මහතා
ඉසුරු රාජපක්ෂ මහතා
ළහිරු ජයසිංහ මහතා
චරණ බටුගහගේ මහතා
තුෂාර සිරිවර්ධන මහතා
වින්දන ඒකනායක මහතා

## ප්‍රකාශන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටු

### ප්‍රචාරක කමිටුව

ප්‍රචාරක නිලධාරී - යමුනි රශ්මිකා පෙරේරා මිය
කෙටි පණිවිඩ ප්‍රචාරණ නිලධාරී - දනේෂ් තමින්ද මහතා
වෙබ් අඩවි සම්බන්ධීකාරක හා ''අපි NPAS''
මුහුණු පොත - මනුජිත් කටුගම්පල මහතා

### පිළිසඳර කමිටුව

1 වසර - මධුෂිකා ලක්මාලි මෙය 0715179052
ආර්. එම්. මඩවල මහතා 0771510173
2 වසර - සී. එස් . දන්තනාරායන මහතා 0717757685
3 වසර - රුසිරු තරංග පෙරේරා මහතා 0725392294

### ලංකා කැමරා කමිටුව

ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ මහතා
රවීන්ද්‍ර පුෂ්පකුමාර මහතා

# 2015 සැප්තැම්බර් මාසික ඡායාරූප තරගය

විල්සන් හැගොඩ ශූරතාව සඳහා වන සත්වෝද්‍යාන චාරිකා ඡායාරූප තරගය 2015 සැප්තැම්බර් මාසික තරගය ලෙස පවත්වන ලදී. එහි ජයග්‍රාහක නාමලේඛනය, කෘති තේරීම සහ විචාරයට දායක වූ දෙටු සාමාජික පිරිස පහත සඳහන් ය.



ඕෂධ චමිල
(විල්සන් හැගොඩ ශූරතාව)

**සමස්ත තරග ප්‍රතිඵල.**

**කලු සුදු**

01. ඕෂධ චමිල
(විල්සන් හැගොඩ ශූරතාව)
02. ශ්‍යාම් කුමාර 'බලන්න මා දෙස'
03. දිනේෂ් ජයවර්ධන 'මිතුරුතොමෝ'
04. ශ්‍යාම් කුමාර 'Waiting'

**වර්ණ**

01. ශ්‍යාම් කුමාර 'Nap'
02. පී. නිරංජන්
02. ජගත් සූරියප්පෙරුම
03. දිනේෂ් ජයවර්ධන 'ජීවිතය අයැදීම'
03. ජගත් සූරියප්පෙරුම

**ඇගයීම් කමිටුව :** ප්‍රියන්ත අමරසිංහ මහතා, සංඛ සම්මාන පෙරේරා මහතා, අමන්දා සමානි ජයවර්ධන මෙනෙවිය

---

## 2015 ජනවාරි විභාග ප්‍රතිඵල නිකුත් වේ.

2014 අධ්‍යයන වර්ෂය සඳහා 2015 ජනවාරි මස පවත්වන ලද වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණයේ ප්‍රතිඵල දැන් නිකුත් කර තිබේ. විභාග අපේක්ෂකයන්ට ඒ පිළිබඳව කෙරෙන පෞද්ගලික දැනුම් දීම් මේ වන විට සිදු කෙරේ.

| පරීක්ෂණය | විශිෂ්ට සම්මාන | සම්මාන සාමාර්ථ | සාමාන්‍ය සාමාර්ථ | අසමත් |
|---|---|---|---|---|
| ප්‍රථම වසර | 03 | 18 | 34 | 37 |
| දෙවන වසර | -- | 10 | 25 | 15 |
| ඩිප්ලෝමා | -- | 10 | 10 | 11 |

සාමාර්ථය ලත් සියලු දෙනාට සංගමයේ ශුභාශිංසන පිරිනමන අතර විභාගයට සාර්ථක ව මුහුණ දීමට නොහැකි වූ අයට මෙම අධ්‍යයන වර්ෂයේ අවසන් පරීක්ෂණවල දී එම අඩු පාඩු සම්පූර්ණ කර ගැනීමට ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරමු.

# එන්න, දොර කවුළු විවෘත කොට තිබේ

සංගම් මූලස්ථානය ඉදිකිරීම ඇතුළු සංගමයේ පරිපාලන, අධ්‍යාපන, සංවර්ධන, සමාජ සේවා සහ ප්‍රකාශන අංශවල සිදු කෙරෙමින් පවතින වැඩි වර්ධනයන් සඳහා ඔබගේ සහෝදරාත්මක දායකත්වය ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ගෞරවයෙන් අපේක්ෂා කරයි. කිසියම් ම හෝ හේතුවක් නිසා පසුගිය කාලයේ හුරුපුරුදු ලෙන්ගතු බවින් සංගමයේ කටයුතුවලට සම්බන්ධ වන්නට ඔබට අවකාශ නොලැබිණි නම් දැන් ඒ දුරස් බව පසෙක තබා අප සමග එක් වන්න.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකායන බලාපොරොත්තුව ඔබේ සහෝදරාත්මක දෑත් ද සමගින් අත්වැල් ගෙන සංගමයේ අනාගතය වෙත පා නැගීමයි. මේ ලෙන්ගතු ආරාධනය ඒ වෙනුවෙනි.

**ඇමතුම් : උදිත - 0718106680, විජය - 0718229209, ශාන්ත - 0777519679, තුෂාර - 0714894848**

# සංගමයේ දේපළ ආරක්‍ෂා කරමු.

සංගමය සතුව ඇති බඩු බාහිරාදිය විවිධ අවශ්‍යතා සහ ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් විවිධ සාමාජිකයින් භාරයේ රඳවා තැබීමට සිදු වූ බව ඔබ හොඳින් දන්නා කරුණකි. ඒවා නැවත ගනන් බැලීමට හා තත්ව පරීක්ෂාවකට බඳුන් කළ යුතුව ඇති බැවින්, ඔබගේ ආරක්ෂාවට යටත්ව සංගමයේ කුමන හෝ බඩු භාණ්ඩයක් පවතී නම් කරුණාකර ඒ ගැන මුදල් අධ්‍යක්ෂ තිනේෂා එදිරිසිංහ මෙනෙවියට (0779144798) දැනුම් දෙන්න.

මෙය සංගමයේ තොග සමීක්ෂණ කාර්යයක් (Inventory Checking) වශයෙන් වාර්ෂිකව සිදුකළ යුතුව තිබෙන්නක් නිසා මේ සඳහා ඔබගේ සහය ගෞරවයෙන් අපේක්ෂා කරමු.

---


### පිළිසඳරට වෙහෙස මහන්සිය

ප්‍රකාශන අධ්‍යක්ෂ - සමල් පෙරේරා

පිළිසඳර - ප්‍රකාශන අනු කමිටුව

1 වසර - මදූෂිකා ලක්මාලි මෙය
ආර්. එම්. මඩවල මහතා
2 වසර - සී. එස්. දන්තනාරායන මහතා
3 වසර - රුසිරු තරංග පෙරේරා මහතා


---